# 21

# ළමා අපට සොඳුරු මොහොතක්





මම පාසල ඇරී ගෙදර එමි. ගෙදර දී කළ යුතු පාසල් වැඩ ඉක්මනින් නිම කරමි. හවස් වරුව නිදහසේ ගත කිරීමට මා තුළ ඇත්තේ පුදුම ආසාවකි. ඒ සඳහා මම නිතර නිවස ඉදිරිපිට ඇති ගල්තලාව වෙත යමි. ගල්තලාවේ වාඩිවෙන මම වටපිට බලමි. පුරුදු පරිදි ඉෂාර, තරින්ද, චලනි, රසාංගා යන මිතුරු මිතුරියෝ එති. ඔවුහු මා මෙන් ම අවට පරිසරය නැරඹීමට ආසා කරති.

“අර බලන්න අර ඈත පෙනෙන කඳුවැටිය,” යි චලනි ඇතින් පෙනෙන කඳුවැටිය දෙසට අත දිගුකර පෙන්වයි. “කොච්චර බැලුවත් ඇති වීමක් නෑ.” ඉෂාර කියයි. “අපි දවසක කන්දට නඟිමු! මම යාළුවන් දෙස බලමින් කියමි.

“මේ බලන්න පහළ වෙල්යාය” තරින්ද කියයි. වී කරල් සුළඟට සෙලවෙන හැටි හරි ලස්සනයි නේ ද? රසාංගා එදෙස බලමින් පවසයි. පැසුණු වී කරල් රටාවකට සුළඟේ සැලෙයි. මගේ සිත සතුටින් පිරෙයි. උදැල්ල කර තබා ගත් ගොවියෙක් ආඩම්බරයෙන් නියර දිගේ එයි.

අපි ගල්තලාවෙන් පහළට බැස, කුඹුරු යායට පිවිසෙමු. වී කුරුල්ලෝ පැසුණු ගොයම් අතර එහා මෙහා ඉගිළෙති. තරින්ද එදෙස සිනාසෙමින් බලා සිටියි. නියර පුරා තණ කොළ ද, පුංචි පැළෑටි ද ඇත. පැළෑටිවල මල් පිපී සැලෙයි. විවිධ පාටින් යුතු ඒ මල් කුඹුරුයායේ අලංකාරය තවත් වැඩි කරයි. ඉෂාර දුන් නියරේ වක්කඩ ළඟ ය. ඔහු ගලා යන දියෙහි තිත්ත පැටවුන් පොරකන දෙස බලා සිටියි. මම වක්කඩට බැස වතුරේ හැදෙන සුදු පෙණ අතින් අල්ලමින් විනෝද වෙමි.

කුඹුරු යාය කෙළවර ඔයක් ඇත. ඔය දෙපස ලන්ද බොහෝ පලතුරුවලින් පිරී ඇත.

"එන්න අපි අර ඔයේ ඉවුරට ගොඩවෙමු." තරින්ද කියයි. "අර නියර දිගේ ගිහින් ඉවුරට යන්න ඕනෑ." මම තරින්දට කීවෙමි. "මේ දං ගහේ ගෙඩි පිරිලා. මේං ඇඹිල්ලත් තියෙනවා." අපි ලන්දට වැදී ඇඹිල්ල අත්තක් පහත් කර ඇඹිල්ල කඩමු. කඩන කඩන ඇඹිල්ල රසාංගා කටේ දමා ගනියි. තරින්ද ඒ දැක කෑ ගසයි. ඉෂාර දං පොකුරක් කඩා ගනියි. කාලය ගෙවී යන අයුරු අපට නො දැනේ. කළුවර වැටී ගෙන එන විට අපි ආපසු ගෙවල් බලා යන්නට සැරසුණෙමු.



"අන්න පොඩි මාමා අර නියර දිගේ යනවා." මම කීවෙමි. අපි එයත් එක්ක ම යමු.

"පොඩි මාමේ! පොඩි මාමේ! අපිත් එනවෝ." අපි එකා පසු පස එකා බැගින් නියර දිගේ පොඩි මාමා දෙසට දිවීමට පටන් ගත්තෙමු.

## ක්‍රියාකාරකම 01

පාඩම කියවා පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු උක්ත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
பாடப்புத்தகத்தின் பாடத்தை வாசித்து பின்வரும் வாக்கியங்களின் இடைவெளிகளுக்கு பொருத்தமான எழுவாய் சொற்களை இட்டு பூரணப்படுத்துக.

i. ............................ පාසල ඇරී ගෙදර එමි.

ii. ............................ දවසක කන්දට නඟිමු.

iii. ............................ එදෙස බලමින් පවසයි.

iv. ............................ අවට පරිසරය නැරඹීමට ආසා කරති.

v. ............................ ආඩම්බරයෙන් නියර දිගේ එයි.

vi. ............................ පහළට බැස කුඹුරු යායට පිවිසෙමු.

vii. ............................ දං පොකුරක් කඩා ගනියි.

viii. පුංචි පැළෑටිවල ............................ පිපී සැලෙයි.

ix. ............................ ඇඹිල්ල අත්තක් පහත් කර ඇඹිල්ල කැඩුවෙමු.

x. ............................ නිතර නිවස ඉදිරිපිට ඇති ගල්තලාව වෙත යමි.

## ක්‍රියාකාරකම 02

පහත දී ඇති වාක්‍ය ලිඛිත භාෂාවෙන් ලියන්න.
கீழே கொடுக்கப்பட்டுள்ள வாக்கியங்களை எழுத்து மொழியில் எழுதுக.

උදහරණය අක්කා ගවුමක් මහනවා.
අක්කා ගවුමක් මසයි.

i. තරින්ද ගල්තලාව පැත්තට එනවා.

ii. ඉෂාර නියරේ වක්කඩ ළඟ ඉන්නවා.

iii. අපි වෙල පහළට යනවා.

iv. රසාංගා ඇඹිල්ල කනවා.

v. පොඩි මාමා නියර දිගේ යනවා.

vi. වීකුරුල්ලෝ එහා මෙහා ඉගිළෙනවා.

vii. වීකරල් සුළඟට සෙලවෙනවා.

viii. පැළෑටිවල මල් පිපී සැලෙනවා.

## ක්‍රියාකාරකම 03

පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට ගැළපෙන උක්ත පද වරහනින් තෝරන්න.
பின்வரும் வாக்கியங்களுக்குப் பொருத்தமான சொற்களை அடைப்பில் இருந்து தெரிந்து இடைவெளிகளை நிரப்புக.

i. .............................. පාරේ යයි.

ii. ............................ පාසල් ගියා ය.

iii. ............................ පොත බලමි.

iv. ............................ සින්දු කියති.

v. ............................ වැවට ගියෙමු.

vi. ............................ ඉහළ අහසේ පියාඹයි.

vii. ............................ ගසින් බිමට වැටෙයි.

(අපි, වඳුරා, ළමයි, මම, නංගී, කුරුල්ලා, මිනිසා)

## ක්‍රියාකාරකම 04

පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ වීමට අවශ්‍ය උක්ත පද හෝ ආඛ්‍යාත පද හෝ වරහනින් තෝරා ලියන්න.
பின்வரும் வாக்கியங்களைப் பூரணப்படுத்த அவசியமான எழுவாய்களை அடைப்பில் இருந்து தெரிந்து எழுதுக.

i. ........................ සෙල්ලම් ගෙයක් සාදමි.

ii. අපි විනෝද ගමනක් ............................

iii. ........................... පාසල පිරිසිදු කරති.

iv. ........................... ගීයක් ගයයි.

v. ගංගා පහළට ගලා ..............................

vi. ........................... කුඹුරෙහි වී ඉසිති.

vii. ගුරුවරු දරුවන්ට අවවාද .............................

viii. ............................ අහස පුරා බබළයි.

ix. මම පාසලේ ශ්‍රමදානයට සහභාගි ..........................

x. මල් පරවී ...........................

(ළමයි, නංගී, ගොවියෝ, යමු, මම, බසියි, තරු, වෙමි, වැටෙයි, දෙති)